**වැදගත්ය. ඉතා හදිසිය.**

මගේ අංකය :- DE/ADM/PE/2015/01

චක්‍රලේඛ අංක PE/2015/01/ST
මැතිවරණ දෙපාර්තමේන්තුව,
සරණ මාවත, රාජගිරිය.
2015.06.29

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,**

**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,**

**පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,**

**සියලුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු / සාමාන්‍යාධිකාරීවරු,**

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015.08.17

## නිලධාරී සංගණනය

2015 අගෝස්තු මස 17 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සේවයේ නිරත කරවීමට සිදුවන අතර වාහන විශාල සංඛ්‍යාවක් ද අවශ්‍ය වන බැවින් සියලුම රජයේ හා පළාත් සභා කාර්යාලයන්හි නිලධාරීන් හා වාහන සම්බන්ධයෙන් සංගණනයක් සිදු කර මැතිවරණ රාජකාරී සඳහා යෙදවීමට සුදුසු නිලධාරීන් පිළිබඳ තොරතුරු නොපමාව රැස්කර ගැනීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. එහෙයින් මෙම චක්‍රලේඛයෙන් ආමන්ත්‍රිත අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු සියලුම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් හා රාජ්‍ය ආයතන ප්‍රධානීන් මතු සඳහන් පරිදි ක්‍රියා කරනු ඇතැයි ඉතා ඕනෑකමින් අපේක්ෂා කරනු ලැබේ. (සංස්ථා හා මණ්ඩලවලින් , වාහන පිළිබඳ විස්තරවලට අමතරව සැපයිය යුත්තේ එම ආයතනවලට ද්විතියනය කර ඇති රජයේ නිලධාරීන්ගේ නම් පමණකි.) **නිලධාරී සංගණනය සඳහා මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂිත තොරතුරු සැපයීමේ කාර්යය භාරව ක්‍රියා කිරීම සඳහා සහ මැතිවරණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම සඳහා සුදුසු ජ්‍යෙෂ්ඨතම නිලධරයකු වෙත පැවරීමටත්** ***(උදාහරණ වශයෙන් අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් වන විටදී පාලන විෂය භාර අතිරේක ලේකම්වරයා හෝ එකී විෂය භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා, දෙපාර්තමේන්තුවක් සම්බන්ධව වන විටදී දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ අතිරේක ප්‍රධානියා, රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සම්බන්ධයෙන් වන විට සාමාන්‍යාධිකාරී හෝ අතිරේක සාමාන්‍යාධිකාරී)*** **එකී නිලධාරියාගේ නම/ තනතුර හා දුරකථන අංක මේ සමඟ ඇති PE/SO/CO ආකෘතිය මගින් කඩිනමින් මා වෙත හෝ අදාළ තේරීම්භාර නිලධාරී වෙත දැන්වීමටත් ක්‍රියා කරන ලෙස ඉල්ලමි.**

2. කිසිසේත්ම ප්‍රමාද කළ නොහැකි වන්නා වූ, අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවන් පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය නිලධාරීන් පමණක් හැර, අනිකුත් සියළුම රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් මැතිවරණ රාජකාරීවල යෙදවීම පිණිස මෙම දෙපාර්තමේන්තුවට ලබාදීම අත්‍යාවශ්‍යය. මැතිවරණ පැවැත්වෙන දින හා එයට ආසන්නතම දින දෙක තුළ දී රජයේ කාර්යාලවල සාමාන්‍ය කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදුවන අතර, මෙම මැතිවරණය පවත්වනු ලබන්නේ එක් දිනකදී පමණක් වන හෙයින් අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා යෙදවිය යුතුවන නිලධාරීන්ගේ සංඛ්‍යාව දැඩි ලෙස සීමා කළ හැකිය. මැතිවරණ රාජකාරී කටයුතුවල නිරත වීම නිසා තම තමන්ට නියමිත ඡන්ද පොළට ගොස් පුද්ගලිකව ඡන්දය දීමට නොහැකි සියළුම රජයේ නිලධාරීන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසාලන විධිවිධාන ඒ ඒ ඡන්ද විමසීම් පනතට ඇතුළත් කර ඇත. තැපැල් ඡන්ද පහසුකම් පිළිබඳ වූ උපදෙස් දැනටමත් මා විසින් නිකුත කර ඇත. මේ පිළිබඳ විස්තර මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් ද ප්‍රචාරය කරනු ලැබේ. එම උපදෙස් පිළිබඳව ඔබගේ කාර්ය මණ්ඩලය මැනවින් දැනුවත් කිරීමට පියවර ගැනීම මැනවි. තැපැල් ඡන්ද පහසුකම් සඳහා අයදුම් නොකිරීම හෝ නිවැරදි තොරතුරු සැපයීමට අපොහොසත්වීම හෝ අයදුම්පත් ප්‍රමාදවීම හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප වීම හෝ මැතිවරණ රාජකාරීවලින් නිදහස් වීමට හේතු නොවන බව අදාළ සියළුම නිලධාරීන්ට අවධාරණයෙන්ම දැනුම් දිය යුතුවේ.

3. ඡන්ද මධ්‍යස්ථානවල / ගණන් කිරීමේ මධ්‍යස්ථානවල සේවය සඳහා යොදවනු පිණිස ඔබගේ ආයතනයේ සේවය කරන සියළුම නිලධාරීන්ගේ / නිලධාරිණියන්ගේ විස්තර මේ සමඟ සපයා ඇති ආකෘතිවල එක් එක් නිලධාරියා / නිලධාරිණිය ලවා සම්පූර්ණ කරවා ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව CSEP ආකෘති ද සම්පූර්ණ කර ආවරණ ලිපියක් ද සමඟ මෙම චක්‍රලේඛය ලැබී දින 10ක් ඇතුළත ලැබෙන සේ පහත 06 වන

ඡේදයේ උපදෙස් පරිදි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී (දිස්ත්‍රික් ලේකම් / දිසාපති) වෙත හෝ මැතිවරණ මහලේකම් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත යැවිය යුතුය. මෙම ආකෘතිපත්‍රවල අමතර පිටපත් අවශ්‍ය නම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින්/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් (කච්චේරිවලින්) ලබා ගත හැක.
පහත ගණයන්ට අයත් වන නිලධාරීන් හැර, ඔබ කාර්යාලයේ සිටින සියළුම නිලධාරීන් ලවා ස්ත්‍රී/ පුරුෂ භේදයකින් තොරව මෙම ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කළ යුතුය.

i. කැබිනට් අමාත්‍යාංශවල ලේකම්වරු හෝ ඒ හා සමාන තනතුරු දරණ නිලධාරීන්
ii. මෙයට පෙර පැවති කිසියම් ඡන්ද විමසීමකදී අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වී ඇති නිලධාරීන්/නිලධාරිනියන් හා ක්‍රියාකාරී දේශපාලනයේ නිරත වන දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන් / නිලධාරිනියන්
iii. ගර්භනී අවස්ථාවේ පසුවන නිලධාරිනියන්
iv. මව්කිරි දෙන කුඩා අත දරුවන් සිටින නිලධාරිනියන් හා ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන්
v. ඉදිරි තුන් මසක කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන් / නිලධාරිනියන්
vi. බෞද්ධ භික්ෂූන් වහන්සේ හා වෙනත් ආගමික පූජකවරුන්
vii. තාවකාලික/අනියම්/ආදේශක/අභ්‍යාසලාභී/කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ඇති තැනැත්තන් /නැවත සේවයේ යෙදවූ විශ්‍රාමිකයන්

- ✶ ඉහත සඳහන් කාණ්ඩවලට අයත් නිලධාරීන් හැර අදාළ ආයතනයේ සේවයේ නියුතු සෙසු සියළුම නිලධාරීන් / නිලධාරිනියන්ගේ නම් CSEP ආකෘතියට ඇතුළත් කළ යුතු අතර එහි නම් සඳහන් සියලුම නිලධාරීන්/නිලධාරිනියන් ලවා නිලධාරී සංගණන ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කිරීමට ක්‍රියා කරන බවට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු විසින් නිසැක විය යුතු වේ.
- ✶ ඉහත (ii) සිට (vi) දක්වා වූ ගණයන්ට අයත්වන තොරතුරු සැපයීම අනවශ්‍ය නිලධාරීන්/ නිලධාරිනියන් සම්බන්ධයෙන් වාර්තාවක් ඒ සඳහා වූ El/Du/Ex ආකෘතියේ සැපයීම අවශ්‍යවේ.
- ✶ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නිලධාරීන් වෙනත් කාර්යාලවලට අනුයුක්ත කර ඇති විටදී එවැනි නිලධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ අනුයුක්ත කර ඇති කාර්යාලය හරහාය.
- ✶ නිලධාරීන්ගේ තොරතුරු සැපයීම සඳහා ආකෘති පත්‍ර (දත්ත පත්‍ර) පහත සඳහන් පරිදි වර්ග 4 කින් සපයා ඇති අතර, තොරතුරු සපයන නිලධාරීන් පිළිබඳව වාර්තා කිරීම සඳහා CSEP 1 (කාර්යාල ) හා CSEP 2 (පාසැල්) ආකෘති ද සපයා ඇත. එක් නිලධාරියෙකු වෙනුවෙන් ආකෘති පත්‍ර (දත්ත පත්‍ර) එක් පිටපතක් පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

<u>තොරතුරු සැපයීමේ ආකෘති පත්‍ර (දත්ත පත්‍ර) වර්ග</u>

- සහකාර තේරීම්භාර නිලධාරී / ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති - ARO/SPO (M/F)
- කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති / ලිපිකරු (පිරිමි) - JPO/CL(M)
- කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති / ලිපිකරු (ගැහැණු) - JPO/CL (F)
- විදුහල්පති සේවය හා ගුරු සේවය - SCH

ඉහත ARO (M), ARO (F) , SPO (M), SPO (F) , JPO (M), JPO (F), CL (M), CL (F) යන නිලධාරී කාණ්ඩ සඳහා සහ ගුරුවරුන් / ගුරුවරියන් සඳහා අදාළ පරිදි වෙන වෙනම CSEP ආකෘති සම්පූර්ණ කිරීම මැනවි. එසේ වුවද, මැතිවරණ රාජකාරිය සඳහා යෙදවීමට සුදුසුකම් ඇති නිලධාරීන් අඩු සංඛ්‍යාවක් (20 ට අඩු) සේවයේ යෙදී සිටින ආයතනයන්හි ඒ ඒ කාණ්ඩවලට අයත් නිලධාරීන් / නිලධාරිනියන් වෙනුවෙන් වෙන වෙනම CSEP ආකෘති සම්පූර්ණ කිරීම වෙනුවට එක් ආකෘතියක සියළු තොරතුරු ඇතුලත් කිරීම ප්‍රමාණවත්ය.

4. නිලධාරීන් පිළිබඳ සංගණන ලැයිස්තු ඉදිරිපත් කිරීමේ වගකීම අදාළ ආයතන ප්‍රධානියා විසින් දැරිය යුතු අතර ඒ ඒ නිලධාරීන් විසින් සපයනු ලබන තොරතුරු ආකෘතියේ ඇතුලත් වැටුප් ක්‍රමයට අදාළ කේතය,වැටුප් පරිමාණය,මාසික වැටුප,අයත් සේවය/පන්තිය/ශ්‍රේණිය යන තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳව එම ආකෘති සහතික කරන මාණ්ඩලික නිලධරයා විසින් පරීක්ෂා කර බලා සනාථ කර ගත යුතුය.

5. අදාළ ආයතන ප්‍රධානියා විසින් මැතිවරණ රාජකාරීවලින් නිදහස් කිරීමක් නිශ්චිතවම නිර්දේශ කරනු ලැබුවහොත් මිස, සෑම නිලධාරියෙකුගේම සේවය මැතිවරණ රාජකාරී සඳහා ලබාගත හැකි සේ සළකනු ලැබේ. ඔබගේ අදහසේ හැටියට ප්‍රමාද කළ නොහැකි කිසියම් අත්‍යාවශ්‍ය රාජකාරියක යෙදවීමට සිදුවන නිසා හෝ නිලධාරියෙකුගේ පෞද්ගලික හේතුවක් මත හෝ යම් නිලධාරියෙකුගේ සේවය ඡන්ද විමසීම් කටයුතු සඳහා ලබාදීමට නොහැකි වන්නේ නම්, ඊට හේතුව ආකෘති පත්‍රවල නිදහස් කිරීමට හේතු දක්වන ස්ථානයේ සඳහන් කර එවිය යුතු අතර, ඔබ විසින් වෙනම ලිපියකින් එම නිදහස් කිරීම නිර්දේශ කළ යුතුය. එම නිර්දේශය අදාළ නිලධාරියාගේ විස්තර ඇතුළත් ආකෘති පත්‍රයට අමුණා එවිය යුතුය. (අවශ්‍ය නම් වැඩි විස්තර වෙනම කඩදාසියක ලියා එම ආකෘති පත්‍රයට අමුණා එවිය යුතුය)

**6. මූලික සංගණන ලියවිලි සහ නිලධාරී දත්ත පත්‍ර එවිය යුතු ආකාරය**

**6.1. රාජගිරියේ මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත එවිය යුතු සංගණන ලේඛන**

(අ). **කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුල** පිහිටා ඇති සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රජයේ කාර්යාල

(ආ) ඉසුරුපාය, සෙත්සිරිපාය, සම්පත්පාය, ගොවිජන මන්දිරය යන කාර්යාල සංකීර්ණයන්හි පිහිටා ඇති සියළුම කාර්යාල

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ පිහිටි කාර්යාල ඇතුළු **බත්තරමුල්ල තැපැල් කාර්යාල බල ප්‍රදේශය තුල පිහිටි** සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු

(ඈ) ඉහත සඳහන් වර්ගීකරණයට අයත් නොවන නමුත් කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු
උදා:- .ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**යන සියළුම කාර්යාලවල සේවයේ නියුතු සහකාර තේරීම්භාර නිලධාරී ගණයට අයත්වන සියළුම නිලධාරීන්ගේ (ස්ත්‍රී/පුරුෂ) දත්ත පත්‍ර ARO (M) හා ARO (F) සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ගණයට අයත්වන පිරිමි නිලධාරීන්ගේ සියළුම දත්තපත්‍ර SPO(M) සහ මූලික සංගණන ආකෘති රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ( පාලන ) වෙත එවිය යුතුය.**

**සහකාර තේරීම් භාර නිලධාරීන්ගේ දත්තපත්‍ර සම්පූර්ණ කිරීමේදී නම, තනතුර හා සේවා ස්ථානය ඉංග්‍රීසි භාෂාවෙන්ද ලිවීම අත්‍යාවශ්‍යය.**

✶ යම්කිසි කාර්යාලයක/ ආයතනයක නිලධාරීන්ගෙන් වැඩි පිරිසකගේ දත්ත පත්‍ර ලැබී ඇති අවස්ථාවකදී සියලුම දත්ත පත්‍ර එකතු වන තෙක් ඒවා රඳවා ගැනීමෙන් වැළකී සිටිය යුතු අතර, ප්‍රමාද වී දත්ත පත්‍ර ඉදිරිපත් කරන නිලධාරීන්ගේ දත්ත පත්‍ර වෙනම ආවරණ ලිපියක් සමඟ කඩිනමින් එවීමට යටත්ව එකතු කර ඇති ආකෘති අදාළ පරිදි තේරීම්භාර නිලධාරී/ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස් හෝ මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවීමට ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

**6.2. කොළඹ මැතිවරණ කාර්යාලය වෙත එවිය යුතු සංගණන ලේඛන**

(අ) ඉහත 6.1 හි සඳහන් කාර්යාලවල සෙසු නිලධාරීන්ගේ /නිලධාරිනියන්ගේ දත්ත පත්‍ර (SPO(F), JPO/CL(M), JPO/CL (F) ) හා මූලික සංගණන ආකෘති (CSEP 1)

(ආ) ඉහත 6.1 හි සඳහන් නොවන කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සෙසු සියළුම රජයේ කාර්යාලවල සේවයේ නියුතු සියළුම නිලධාරීන්ගේ /නිලධාරිනියන්ගේ දත්ත පත්‍ර (ARO(M/F), SPO(M/F), JPO/CL(M), JPO/CL(F) ) හා (CSEP 1) සංගණන ආකෘති

(ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සියළුම රජයේ පාසැල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන්/වරියන් හා ගුරුවරුන්/වරියන් ගේ දත්ත පත්‍ර (SCH) හා මූලික සංගණන ආකෘති (CSEP 2)

(ඈ) මේ පිළිබඳව විශේෂ උපදෙස් කොළඹ තේරීම්භාර නිලධාරි විසින් නිකුත් කරනු ඇත.

**<u>මෙම ලේඛන තේරීම්භාර නිලධාරී, කොළඹ මැතිවරණ කාර්යාලය, 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට එවිය යුතුය.</u>**

**6.3.** ***<u>කොළඹ හැර සෙසු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත එවිය යුතු සංගණන ලේඛන</u>***

(අ) කොළඹ හැර සෙසු දිස්ත්‍රික්කවල පිහිටි සියළුම රජයේ කාර්යාලවල සේවයේ නියුතු සියළුම නිලධාරීන්ගේ/නිලධාරිනියන්ගේ දත්ත පත්‍ර (ARO(M/F), SPO(M/F), JPO/CL(M), JPO/CL(F) ) හා මූලික සංගණන ආකෘති (CSEP 1) ඒ ඒ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දන්වා එවනු ලබන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත හෝ මැතිවරණ කාර්යාලය වෙත යැවිය යුතුය.

(ආ) කොළඹ හැර සෙසු දිස්ත්‍රික්ක සියල්ලෙහි පිහිටි සියළුම රජයේ පාසැල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන් /වරියන් හා ගුරුවරුන් /වරියන් ගේ දත්ත පත්‍ර (SCH) හා මූලික සංගණන ආකෘති (CSEP 2) ඒ ඒ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දන්වා එවනු ලබන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත හෝ මැතිවරණ කාර්යාලය වෙත යැවිය යුතුය.

**6.4.** පහත දැක්වෙන 6.5 අනුඡේදයේ සඳහන් දෙපාර්තමේන්තු වල හැර අනෙකුත් සියළුම දෙපාර්තමේන්තුවල ඡන්ද විමසීම් කාර්යය සඳහා යොදවනු ලැබීමට හැකියාව ඇති **<u>සියළුම නිලධාරීන්</u>** ලවා අදාළ කාර්ය පරිපාටියට අනුව ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කරවීමට ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියා කළ යුතුය.

**6.5.** **තැපැල් දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ** අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යෑමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හැර ඡන්ද විමසීම් කටයුතු සඳහා පහසුවෙන් මුදාහැරිය හැකි සහ ඡන්ද විමසීමේ කාර්යයන්ට අදාළ ලිපි කටයුතුවල නිරතවීමට අත්‍යාවශ්‍ය හැකියාව සහිත සියලුම නිලධාරීන් ලවා සම්පූර්ණ කරන ලද ආකෘතිපත් නියමිත ආවරණ ලිපි සමඟ ඉදිරිපත් කළ යුතුය.

**6.6** **සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්** විසින් ස්වකීය කාර්යාලයීය නිලධාරීන්ගේ දත්ත ආකෘති පත්‍ර සමඟ ආරෝග්‍යශාලා කාර්ය මණ්ඩලයේ ගණකාධිකරණ හා කළමණාකරන ක්ෂේත්‍රවලට අයත් නිලධාරීන්ට අමතරව පරිපාලන කටයුතු භාරව කටයුතු කරන වෛද්‍යවරුන් සහ හෙද සේවා හා අතුරු වෛද්‍ය සේවා නිලධාරීන් ද ඇතුලු සෙසු නිලධාරීන් අතුරින් මැතිවරණ රාජකාරි සඳහා පහසුවෙන් මුදාහැරිය හැකි සියලුම නිලධාරීන් ලවාද ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා නියමිත ආවරණ ලිපි සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

**7.** **ඒ ඒ නිලධාරීන්ගේ තොරතුරු ආකෘතිවලට ඇතුලත් කිරීමේදී මතු සඳහන් කාර්ය පරිපාටි විස්තරය අනුව ක්‍රියා කළ යුතුය.**

<u>**කාර්ය පරිපාටිය**</u>

**7.1 සහකාර තේරීම්භාර නිලධාරීන් :-**

(I) රු.22,935-10x645-8x790-17x1050-53,555 වැටුප් ක්‍රමය හෝ ඊට ඉහළ වැටුප් ක්‍රමයක් හිමි දීප ව්‍යාප්ත සමාන්තර කළමනාකරණ සේවාවන්හි නිලධාරීන්

සටහන :- **දීප ව්‍යාප්ත සමාන්තර කළමනාකරණ සේවාවලට අයත් හෝ ඒ හා සමාන්තර සංවෘත සේවාවන්ට අයත් හෝ විධායක නිලධාරීන් මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වලදී ඡන්ද මධ්‍යස්ථාන රාජකාරීවල නිරත වී ඒ පිළිබඳව පලපුරුද්දක් ලබා නොමැති නම් එවැනි නිලධාරීන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ඡන්ද මධ්‍යස්ථාන භාරව ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

(II) රු. 20,030 – 365x11-500x18-33,045/- වැටුප් ක්‍රමයක් හිමි මාසිකව රු. 21,490/- ක් හෝ ඊට ඉහළ මාසික වැටුපක් ලබන කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් සහ ඒ හා සමාන්තර සේවාවන්හි එවැනි නිලධාරීන්,

සටහන :- **කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් හා ඒ හා සමාන්තර සේවාවන්හි එවැනි නිලධාරීන් මාසිකව රු. 21,490/- ක් හෝ ඊට ඉහළ මාසික වැටුපක් ලැබුවද මීට පෙර පැවති ඡන්ද විමසීම් වලදී ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි වල නිරතවී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ඡන්ද මධ්‍යස්ථාන භාරව ක්‍රියා කර නොමැති නම් එවැනි නිලධාරීන් සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස පත්කිරීමට අපහසු හෙයින් ස්වකීය දත්ත පත්‍ර (ARO/SPO) සමග ඡන්ද විමසීම් රාජකාරී සම්බන්ධයෙන් පළපුරුද්ද පිළිබඳව විශේෂ සටහනක් ඉදිරිපත් කළ යුතුය. එබඳු නිලධාරීන් ඡන්ද විමසීම් කාර්යයේදී ජ්‍යෙෂ්ඨ ඡන්දස්ථානාධිපති වශයෙන්ද ගණන් කිරීමේ කාර්යයේදී සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන්ද පත් කිරීමට අපේක්ෂා කෙරේ.**

(III) දීමනා රහිත මාසික වැටුප 22,585/- ඉක්මවන ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන් (බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ නිලධාරීන්)

(IV) විදුහල්පති සේවයේ පළමුවන පංතියේ විදුහල්පතිවරුන් / නියෝජ්‍ය විදුහල්පතිවරුන්

සටහන :- **ඉහත III හා IV ඡේද වලට අයත්වන නිලධාරීන් / විදුහල්පතිවරුන් සහකාර තේරීම් භාර නිලධාරීන් <u>ලෙස පත්කරනු ලබන්නේ පූර්ව ඡන්ද විමසීම්වලදී ඉටු කර ඇති කටයුතු සම්බන්ධයෙන්</u> සලකා බැලීමෙන් අනතුරුව හා සේවා අවශ්‍යතාව මත හෙයින් අදාල සියලු තොරතුරු සැපයීමට ක්‍රියා කිරීම අවශ්‍ය වේ. ඡන්ද විමසීමේ කාර්යය සඳහා සහකාර තේරීම් භාර නිලධරයෙකු ලෙස ක්‍රියාකිරීමට ප්‍රමාණවත් තරම් පළපුරුද්දක් රහිත එවැනි නිලධාරීන් ඡන්ද විමසීම් කාර්යයේදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් ලෙසද ඡන්ද ගණන් කිරීම සඳහා බලලත් නිලධාරීන් ලෙසද පත්කරනු ලැබෙනු ඇත.**

** **ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණ සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස පත් කරනු ලබන්නේ අවම වශයෙන් එක්වරක්වත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු ලෙස හෝ අතිරේක ඡන්ද ස්ථානාධිපතිවරයෙකු ලෙස හෝ දෙවරක්වත් කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු ලෙස ඡන්දපොල රාජකාරීවල නිරත වී ඇති පෙර සඳහන් කණ්ඩායම්වලට අයත් නිලධාරීන් පමණකි.**

**7.2 ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් :-**

(I) ඉහත 7.1 (II) හි රු.21,490/-ට අඩු මාසික වැටුපක් ලබන නිලධාරීන්,

(II) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ හා ඒ හා සමාන්තර සේවාවල I වන පන්තියේ නිලධාරීන්ට අදාළ රු.17,550 - 5x240-14x320-23,230 මාසික වැටුප් ක්‍රමයේ හෝ ඊට ඉහළ වැටුප් ක්‍රමයක් හිමි මාසිකව රු.18,030/- කට නොඅඩු වැටුපක් ලබන නිලධාරීන්,

(III) රු. 18,030/- කට වැඩි දීමනා රහිත මාසික වැටුපක් ලබන ආශ්‍රිත නිලධාරීන් හා කාර්යාලගත / ක්ෂේත්‍රගත නිලධාරීන් (බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ නිලධාරීන්)

(IV) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියේ විදුහල්පතිවරුන්

(V) ශ්‍රී ලංකා ගුරු සේවයේ I වන පන්තියේ ගුරුවරුන්,

(VI) මෙයට පෙර අවස්ථා තුනකදීවත් කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු ලෙස ඡන්දපොල රාජකාරී ඉටු කර තිබීම.

> ✶ **ශ්‍රී ලංකා ගුරු සේවයේ I පන්තියේ ගුරුවරියන් දත්තපත්‍ර එවිය යුත්තේ ඡන්දපොල හෝ ඡන්ද ගණන් කිරීමේ රාජකාරීවල නිරතවීමට කැමති නම් පමණි. දත්ත පත්‍ර ඉදිරිපත් නොකරන එවැනි ගුරුවරියන්ගේ නම් ද El/ Du/ Ex වාර්තාවට ඇතුලත් කර එවිය යුතුය.**

(අ) සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස වර්ග කරනු ලබන මාණ්ඩලික නිලධාරීන්ගේ ගණයට අයත් නොවන එහෙත් එම ගණයට අදාළ අවම මාසික වැටුපට වඩා වැඩි වැටුප් ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් හා විදුහල්පති සේවයේ II පන්තියේ Iශ්‍රේණියේ විදුහල්පතිවරුන් ඡන්ද විමසීමේදී ඡන්දපොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්දස්ථානාධිපතිවරුන් ලෙස පත් කරනු ලැබෙනු ඇති අතර ඡන්ද ගණන් කිරීමේදී අධීක්ෂණ මට්ටමේ තනතුරක් වූ වාහක නිලධාරීන් (Transfer Officers) නැතහොත් බලලත් නිලධාරීන් (Warrant officer)ලෙස පත් කරනු ලැබීමට යෝජිතය.

(ආ) රු. 18,030/- ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන නමුත්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් තිබිය යුතු කාර්යක්ෂමතාව සහ හැකියාව සහතික නොකෙරෙන වෙනත් ක්ෂේත්‍රයන්ට අදාළ හැකියාවන් සහිත නිලධාරීන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් ලෙස වර්ග නොකළ යුතු අතර, ඔවුන් ලවා කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන්ට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ගත යුතුය.

(ඇ) ඉහත II හි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා යෝජිත වැටුප් තලයට (මාසික රු.18,030/-) වඩා අඩු වැටුපක් ලබන නමුත් මෙයට පෙර ඡන්ද විමසීම් වලදී ඡන්ද මධ්‍යස්ථාන භාරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ක්‍රියාකර ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ (හෝ එයට සමාන්තර සේවාවල I පන්තියේ) නිලධාරීන් සහ සංවෘත සේවාවල එවැනි තනතුරු දරණ මාසිකව (දීමනා රහිතව) රු. 17,550/- ක් ඉක්මවන වැටුපක් ලබන නිලධාරීන් සේවා අවශ්‍යතාව අනුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි නිලධාරීන් ස්වකීය දත්ත පත්‍ර (ARO/SPO) සමඟ ඡන්ද විමසීම් රාජකාරී සම්බන්ධයෙන් වූ පලපුරුද්ද පිළිබඳව විශේෂ සටහනක් සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ) බඳවා ගැනීමේ සුදුසුකම ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ ආශ්‍රිත නිලධාරීන් හා කාර්යාලගත / ක්ෂේත්‍රගත නිලධාරී තනතුරු දරණ නිලධාරීන් ඉහත සඳහන් රු. 18,030/- ට අඩු හා එහෙත් රු. 16,935/- හෝ එයට වැඩි දීමනා රහිත මාසික වැටුපක් ලබන්නේ නම් හා එම නිලධාරීන් මෙයට පෙර ඡන්ද විමසීම් වලදී එක්වරක් හෝ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ අවස්ථා තුනකදී කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ ඡන්ද මධ්‍යස්ථාන රාජකාරී වල නිරත වී ඇත්නම් එවැනි නිලධාරීන් සේවා අවශ්‍යතා අනුව ඡන්ද මධ්‍යස්ථාන භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි නිලධාරීන් ස්වකීය දත්ත පත්‍ර (ARO/SPO) සමඟ ඡන්ද විමසීම් රාජකාරී සම්බන්ධයෙන් වූ පලපුරුද්ද පිළිබඳව විශේෂ සටහනක් ඉදිරිපත් කළ යුතුවේ.

(ඉ) මෙයට පෙර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ *ඡන්ද නිලධාරී (ලිපිකරු)* තනතුරක හෝ ඡන්ද ගණන් කිරීමේ කටයුතු කර නැති ඉහත (I) හා (V) ගණයට අයත් නිලධාරීන් කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 7.3 කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් :-

I. ඉහත 7.2 (ආ) සටහන අනුව කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස වර්ග කළ නිලධාරීන්

II. ඉහත (ආ) II යටතේ දැක්වෙන රු. 17,550-5x240-14x320-23,320/- හෝ එවැනි වැටුප් පරිමාණයක් හිමි එහෙත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය පලපුරුද්ද නොමැති නිලධාරීන්

III. මාසිකව රු. 18,030/- ට අඩු රු. 16,935/- හෝ එයට වැඩි වැටුපක් ලබන නමුත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය පලපුරුද්ද නොමැති ආශ්‍රිත හා කාර්යාලගත / ක්ෂේත්‍රගත නිලධාරීන් සහ මාසිකව රු.16,935/- ට අඩු වැටුපක් ලබන ආශ්‍රිත නිලධාරීන්

IV. රු.15,610-11x170-7x240-19,160 වැටුප් පරිමාණයක් හෝ එයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි මාසිකව දීමනා රහිතව රු.15,610/- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරීන්

V. මෙයට පෙර අවස්ථා තුනකදීවත් කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු ලෙස ඡන්දපොල රාජකාරී කර නොමැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ හා 3 වන පන්තියේ විදුහල්පතිවරුන්

VI. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියේ ගුරුවරුන්

**සටහන (I)** : - ඉහත 7.3(V) හි සඳහන් විදුහල්පතිවරුන් මෙයට පෙර මැතිවරණවලදී එක්වරක් හෝ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ අවස්ථා දෙකකදීවත් කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි වල නිරත වී ඇතිනම් එවැනි නිලධාරීන් සේවා අවශ්‍යතා අනුව ඡන්ද මධ්‍යස්ථාන භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි නිලධාරීන් ස්වකීය දත්ත පත්‍ර (ARO/SPO) සමඟ ඡන්ද විමසීම් රාජකාරී සම්බන්ධයෙන් වූ පළපුරුද්ද පිළිබඳව විශේෂ සටහනක් ඉදිරිපත් කළ යුතුවේ.

**සටහන (II)** **:-** තම හැකියාව හා පුහුණුව අනුව කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු වශයෙන් තිබිය යුතු කාර්යක්ෂමතාව සහතික නොකෙරෙන වෙනත් ක්ෂේත්‍රයන්හි නියුතු නිලධාරීන් ලවා ඡන්දපොළ ලිපිකරු නිලධාරීන්ට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කළ යුතුය.

## 7.4 ඡන්ද නිලධාරීන් (ඡන්ද පොළ ලිපිකරුවන්) :-

I. ඉහත 7.3 හි සටහන (II) දැක්වෙන කාණ්ඩයට අයත් නිලධාරීන් සහ,

II. රු.13,990-18x145-16,600 වැටුප් පරිමාණයක් හෝ එයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි මාසිකව රු .13,990- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරීන්,

III. 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ MN - 1 වැටුප් ක්‍රමය හිමි පරිවාස කාලය ඉක්මවූ රජයේ නිලධාරීන්

IV. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ හා 3 වන පන්තියේ I වන හා II වන ශ්‍රේණියේ ගුරුවරුන් සහ ආධුනික ගුරුවරුන්

**සටහන :-** ඉහත 7.4 (II) හි දැක්වෙන වැටුප් පරිමාණයට වඩා අඩු වැටුප් පරිමාණයක් හිමි රජයේ නිලධාරීන් සේවා අවශ්‍යතාවක් ඇති වුවහොත් පමණක් ඡන්ද නිලධාරීන් (ඡන්දපොළ ලිපිකරුවන්) ලෙස යොදා ගැනීමට අපේක්ෂිතය. ඉහත නිලධාරීන් වර්ග කිරීමේදී වැටුප් පියවර ගණනය කර ඇත්තේ 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 සහ 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) යන චක්‍රලේඛයන්හි ප්‍රකාර ගෙවන වැටුප පදනම් කරගෙනය.

**8.** **පොදු කරුණු :-**

8.1 නිලධාරියෙකුගේ වැටුප පිළිබඳව තීරණය කිරීමේදී ඔහුට ගෙවන දීමනා සැලකිල්ලට නොගත යුතුය.

8.2 CSEP ආකෘතිපත්‍ර ඉදිරිපත් කිරීමේදී නිලධාරීන්ගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව නම් සටහන් කළ යුතු වේ. ආයතන හෝ පාසැල් වෙනුවෙන් සංකේත අංකයක් සඳහන් කර ඇත්නම් CSEP ආකෘතිවල අදාළ ස්ථානයේ එම සංකේත අංකය සටහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

8.3 තම කොට්ඨාසය තුළ සිදුකළ යුතු කාර්යයන් සඳහා තේරීම්භාර නිලධාරීට හෝ පොලීසියට සහාය වීමට අවශ්‍ය වුවහොත් එසේ සහායවීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් හා පරිපාලන ග්‍රාම නිලධරීන් තම තමන්ගේ කොට්ඨාස තුළ රැඳී සිටිය යුතු බැවින්, ඔවුන් ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට ඇතුළත් කළ යුතු නොවේ. එසේ වුවද ප්‍රමාණවත් තරම් මාණ්ඩලික නිලධාරීන් නොසිටින අවස්ථාවකදී හා සේවයේ යෙදවිය හැකි නිලධාරීන් දුර බැහැර ප්‍රදේශවල රාජකාරිය සඳහා යැවීමට නොහැකි වන අවස්ථාවක සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් හා පරිපාලන ග්‍රාම නිලධාරීන් සිය රාජකාරී කොට්ඨාසයෙන් පිටත ඡන්ද විමසීම් රාජකාරිවල නිරත කරවීමට වුවද සිදුවිය හැකිය.

8.4 තම නිල තත්වය හේතුවෙන් ඡන්ද විමසීම් කාර්යයන් සඳහා පත් කරනු ලැබීමට සුදුසු නොවන අධිකරණ නිලධාරීන් , පොලිස් සේවයේ නිල ඇඳුම්ධාරීන් හෝ ග්‍රාම නිලධාරීන් ලවා මෙම ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමක් අපේක්ෂා නොකෙරේ.

8.5 ප්‍රාථමික ශ්‍රේණියට අදාළ කණිෂ්ඨ සේවකයන් වෙතින් මෙම ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමක් අපේක්ෂා නොකෙරේ. එහෙත් ඡන්ද විමසීම් මූලික කටයුතු සඳහා එම සේවකයන්ගේ සහාය ලබාදෙන ලෙස තේරීම්භාර නිලධාරීන් විසින් ඉල්ලා සිටින අවස්ථාවලදී ඔවුන් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

8.6 නිලධාරීන් ලවා ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක වීමට නියමිත ස්ථාන මාරු වේ නම් ඒවාද සැලකිල්ලට ගත යුතුවේ. එවැනි ගණයට අයත් නිලධාරීන් වේ නම් ස්ථාන මාරු නියෝගයේ පිටපතක් සහ නිලධාරියා නියමිත දින අභිනව සේවා ස්ථානයේ වැඩ භාරගැනීමට නිදහස් කරන්නේද යන්න දැක්වෙන ලිපියක් නොගැලවෙන සේ හොඳින් අමුණා අදාළ නිලධාරියාගේ ආකෘති පත්‍රය එවිය යුතු වේ.

**9.** මෙම චක්‍රලේඛය පිළිබඳව ඔබගේ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙසත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ ඇති දිස්ත්‍රික්/ප්‍රාදේශීය හා උප කාර්යාල ප්‍රධානීන් මේ පිළිබඳව දැනුවත් කිරීමටද ක්‍රියා කරන ලෙසත් ඉල්ලමි.

**10** <u>අදාළ දිස්ත්‍රික්කවල ආයතන ප්‍රධානීන්ගෙන් අවශ්‍ය වන වෙනත් උපකාර -</u>

කාර්ය මණ්ඩලය සහ වාහන සපයා දීමට අමතරව මෙම ඡන්ද විමසීම් පැවැත්වීම පිළිබඳ වෙනත් යම් යම් කරුණු වලදී ද ඒ ඒ දිස්ත්‍රික්කවල සිටින ආයතන ප්‍රධානීන්ගේ සහාය ඇතැම් විට මට සහ තේරීම් භාර නිලධාරීන්ට අවශ්‍ය වන අවස්ථා ඇතිවිය හැක. මෙහිලා ඔබගේ සම්පූර්ණ සහයෝගය දෙන මෙන් ඉල්ලා සිටින අතර, ඔබගේ ආයතනයේ සියළුම නිලධාරීන්ටද එසේ සහය ලබා දෙන ලෙස උපදෙස් දෙන මෙන් ඉල්ලමි.

**11.** මෙම චක්‍රලේඛය නිකුත් කරන්නේ දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඊ (1) (2) හා 104 උ ව්‍යවස්ථාවෙන් සහ දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උඋ ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමිෂන් සභාව නැතහොත් මැතිවරණ කොමසාරිස් වෙත පැවරී ඇති බලතල පරිදිය.

**මහින්ද දේශප්‍රිය,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත:** සියළුම දිස්ත්‍රික් ලේකම්වරු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරු } දිස්ත්‍රික් මට්ටමින් රජයේ කාර්යාලවල හා රජයේ පාසල්වල ප්‍රධානීන් දැනුවත් කිරීම වස් හා අවශ්‍ය සෙසු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම පිණිස

PE/SO/CO

මගේ අංකය:
ඔබේ අංකය:DE/ADM/PE/2015/01

කාර්යාලයීය ලිපිනය :......................................................
......................................................
......................................................
දිනය: -

......................................................,
......................................................,
......................................................

<u>**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015.08.17- කාර්ය මණ්ඩල අවශ්‍යතා.**</u>

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් එවන ලද අංක PE/2015/01/ST හා 2015.06.29 දිනැති චක්‍රලේඛය ලද බවත් එහි සඳහන් පරිදි ඡන්ද විමසීම් රාජකාරීවල යෙදවීමට යෝග්‍ය නිලධරයන්ගේ තොරතුරු රැස් කිරීම සඳහා නිසි පරිදි කටයුතු කිරීමට සටහන් කර ගත් බවත්, මෙයින් දන්වා සිටිමි.

02. මෙම කාර්යාලය, මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා නම් කරනු ලබන නිලධාරියාගේ විස්තර මෙහි සඳහන් කරමි.

| | |
|---|---|
| **නම** | |
| **තනතුර** | |
| **කාර්යාල ලිපිනය** | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ජාතික හැඳුනුම්පත් අංකය** | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| **දුරකථන අංකය** | **කාර්යාලය** | | | | | | | | | | |
| | **ජංගම** | | | | | | | | | | |
| | **නිවස** | | | | | | | | | | |
| **විද්‍යුත් තැපැල් ලිපිනය** | | | | | | | | | | | |

......................................................
අත්සන

......................................................
නම සහ තනතුර

*හැකි සෑමවිටම සේවා හඳුනා ගැනීමේ ප්‍රචලිත කෙටි යෙදුම් භාවිතා කරන්න.

**අදාල වන පරිදි ARO/SPO/JPO/CL ලෙස සඳහන් කරන්න

# පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නිලධාරී සංගණනය

CSEP 1

අමාත්‍යාංශය ........................................................... දෙපාර්තමේන්තුව ....................................................................

තැපැල් ලිපිනය ..................................................................................................................................................................................................

දුරකථන අංකය ............................................. ෆැක්ස් අංකය ................................................

| | නිලධාරියාගේ නම | ස්ත්‍රී/ (F)පුරුෂ (M) භාවය* | අයත් සේවය හා ශ්‍රේණිය* | ස්ථිර තනතුර | දීමනා රහිත මාසික වැටුප | වැටුප් ක්‍රමයේ කේත අංකය | ඡන්ද විමසීමට අදාළ තනතුර ** | දත්ත පත්‍රයක් එවා තිබේද නැද්ද යන්න | නිදහස් කළ යුතු නම් හේතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 5 | | | | | | | | | |
| 6 | | | | | | | | | |
| 7 | | | | | | | | | |
| 8 | | | | | | | | | |
| 9 | | | | | | | | | |
| 10 | | | | | | | | | |
| 11 | | | | | | | | | |
| 12 | | | | | | | | | |
| 13 | | | | | | | | | |
| 14 | | | | | | | | | |
| 15 | | | | | | | | | |
| 16 | | | | | | | | | |
| 17 | | | | | | | | | |
| 18 | | | | | | | | | |

නම .........................................................................

තනතුර .......................................................

දිනය ...........................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /ප්‍රාදේශීය ජොෂ්ඨ නිලධාරීගේ අත්සන හා නිල මුද්‍රාව

*හැකි සෑමවිටම සේවා හඳුනා ගැනීමේ ප්‍රචලිත කෙටි යෙදුම් භාවිතා කරන්න.

**අදාල වන පරිදි ARO/SPO/JPO/CL ලෙස සඳහන් කරන්න

## මැතිවරණ කාර්යයන් සඳහා නිලධාරී සංගණනය

CSEP 2

කලාප අධ්‍යාපන කාර්යාලය .............................................................. විද්‍යාලය.....................................................................

තැපැල් ලිපිනය .......................................................................................................................................................

දුරකථන අංකය .............................................. ෆැක්ස් අංකය ...................................................

| | නිලධාරියාගේ නම | ස්ත්‍රී/(F)පුරුෂ (M) භාවය* | අයත් සේවය හා ශ්‍රේණිය* | ස්ථිර තනතුර | දීමනා රහිත මාසික වැටුප | වැටුප් ක්‍රමයේ කේත අංකය | ඡන්ද විමසීමට අදාළ තනතුර ** | දත්ත පත්‍රයක් එවා තිබේද නැද්ද යන්න | නිදහස් කළ යුතු නම් හේතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 5 | | | | | | | | | |
| 6 | | | | | | | | | |
| 7 | | | | | | | | | |
| 8 | | | | | | | | | |
| 9 | | | | | | | | | |
| 10 | | | | | | | | | |
| 11 | | | | | | | | | |
| 12 | | | | | | | | | |
| 13 | | | | | | | | | |
| 14 | | | | | | | | | |
| 15 | | | | | | | | | |
| 16 | | | | | | | | | |
| 17 | | | | | | | | | |
| 18 | | | | | | | | | |

නම .........................................................................

තනතුර ........................................................ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /ප්‍රාදේශීය පෝෂ්‍ය නිලධාරීගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය ...........................